සියලු ම හිමිකම් ඇවිරිණි / (முழுப் பதிப்புரிமையுடையது) / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

නාට්‍ය හා රංග කලාව - සිංහල I
நாடகமும் அரங்கியலும் - சிங்களம் I
Drama and Theatre - Sinhala I

57 S I

5

II කොටස

උපදෙස්:

* A හා B කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරා ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

කාලය: පැය තුනයි

A කොටස

1. (i) දහ අට සන්නිය [illegible] සන්නියකුම් යාගය ගැන කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 03 යි.)
   (ii) සන්නියකුම් යාගයේ ප්‍රබල නාට්‍යමය අවස්ථාවක් තෝරාගෙන එය නාට්‍යමය වන්නේ කවර කරුණු නිසා දැ යි පෙන්වා දෙන්න. (ලකුණු 05 යි.)
   (iii) සන්නියකුම් යාගය හාස්‍යෝත්පාදක නාට්‍යයක ස්වරූපය ගන්නා බව පැවසෙන දයානන්ද ගුණවර්ධනගේ අදහස හා ඔබ එකඟ වන්නේ ද? සාකච්ඡාවක් ගොඩනගන්න. (ලකුණු 07 යි.)

2. (i) සොකරි නාටකය රඟ දැක්වීමේ අරමුණු **තුනක්** පෙන්වා දෙන්න. (ලකුණු 03 යි.)
   (ii) සොකරි නාටකයේ අනුරූපණ අවස්ථා **දෙකක්** උදාහරණ මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)
   (iii) සොකරි හා කෝලම් රංග ශෛලී සංසන්දනය කරන්න. (ලකුණු 06 යි.)

3. (i) ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍ය රඟ දක්වන ප්‍රධාන ස්ථාන **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි.)
   (ii) ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍ය විකාශනය වූ අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)
   (iii) ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍යයක රඟ දක්වනු ලබන ප්‍රධාන අවස්ථා අනුපිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 06 යි.)

B කොටස

4. (i) සංස්කෘත නාට්‍ය කලාවේ එන අර්ථෝපක්ෂේපක නිර්වචනය කරන්න. (ලකුණු 02 යි.)
   (ii) අර්ථෝපක්ෂේපක සියල්ල නම් කරන්න. (ලකුණු 05 යි.)
   (iii) නාට්‍යමය උපක්‍රමයක් ලෙස අර්ථෝපක්ෂේපකවල වැදගත්කම උදාහරණ සහිත ව සාකච්ඡා කරන්න. (ලකුණු 08 යි.)

5. (i) අභිඥානශාකුන්තලයේ ඉතා ම රසවත් අංකය ලෙස විචාරකයන් හඳුන්වන්නේ කවර අංකය ද? (ලකුණු 02 යි.)
   (ii) ඉහත (i) හි ඔබ සඳහන් කළ අංකය එසේ සලකනු ලැබීමට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)
   (iii) ඉහත (i) හි සඳහන් කළ අංකයේ ඔබ සිත් ගත් අවස්ථාවක් පිළිබඳ විචාරයක් කරන්න. (ලකුණු 07 යි.)

6. (i) කුවේණි නාට්‍යයේ රංග ශෛලිය කෙටියෙන් විවරණය කරන්න. (ලකුණු 02 යි.)
   (ii) ගායන පිරිස කුවේණි නාට්‍යයේ විකාශනය පිණිස ඉටු කරන කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)
   (iii) ජීවානන්ද සහ දිසාලාගේ ගායනාවලින් නාට්‍යකරුවා ප්‍රකාශ කිරීමට අදහස් කරන්නේ කුමක් ද යි නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 07 යි.)

* * *